# UNIVERSITY OF PERADENIYA

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර) - නව නිර්දේශය) ආවරණ පරීක්ෂණය 300 මට්ටම - අගෝස්තු 2023**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் - 2023**
**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level - 2023**

**භාෂා ප්‍රවේශය හා සිංහල භාෂාවේ ඉතිහාසය**
**SINE 301**

කාලය පැය(03) තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න පහකට 05ට පමණක් පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

(01). මානව භාෂාව සත්ව - සන්නිවේදනයෙන් වෙනස් වන්නේ කවර ආකාරයෙන්දැ'යි පැහැදිලි කරන්න.

(02). සිංහල භාෂාවේ ප්‍රභවය සිදු වූයේ ද්‍රාවිඩ මූලයන්ගෙන් යැයි සනාථ කළ ජනප්‍රවාදගත තොරතුරු හෝ භාෂා විද්‍යාත්මක තොරතුරු වෙතොත් ඒ කවරේදැ'යි විස්තර කරන්න.

(03). 'සිංහල භාෂාවේ ප්‍රභවය සිදු වූයේ හෙළදිව උපන් ජන කොට්ඨාසවලිනි'යි කුමාරතුංග ප්‍රමුඛ හෙළ හවුල පවසන්නේ කවර සාක්ෂ්‍ය මත පදනම්ව දැ'යි විමර්ශනය කරන්න.

(04). සිංහලයේ ප්‍රභවය හා සම්බන්ධ ව නැගෙනහිර ඉන්දු-ආර්ය හෝ වයඹ-බටහිර ඉන්දු-ආර්ය සාධක වෙතොත්, ඒවා කවරේදැ'යි පැහැදිලි කරන්න.

(05). සිදත් සඟරාවේ කතුවරයා සහ සිදත රචනා කිරීමේ අරමුණ සම්බන්ධයෙන් විද්වතුන් අතර පවතින ප්‍රතිරෝධී අදහස් සමාලෝචනය කරන්න.

(06). සිදත් සඟරාවේ අක්ෂර මාලාව පශ්චාත් කාලීන ව්‍යාකරණඥයින්ගේ විචාරයට ලක් ව ඇති ආකාරය පැහැදිලි කරන්න.

(07). සිදතෙහි පැණෙන විසි වැදෑරුම් වියරණ විදි පශ්චාත් කාලීන ව්‍යාකරණඥයින් විචාරයට ලක් කළ අයුරු සාකච්ඡා කරන්න.

(08). එක්කෝ

සිදතෙහි පැණෙන සන්ධි විධිවල ඌනාධිකතා වෙතොත් ඒවා පැහැදිලි කරන්න.

නැතහොත්

සිදත් සඟරාවෙහි විභක්ති සංකල්පය පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි).

**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර) - නව නිර්දේශය) ආවරණ පරීක්ෂණය 300 මට්ටම - අගෝස්තු 2023**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 300 வது தேர்ச்சி மட்டம் - 2023**
**Bachelor of Arts (External - New Syllabus) Examination 300 Level - 2023**

**සංස්කෘතිය හා ජනශ්‍රැතිය**
**SINE 302**

කාලය පැය(03) තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three (03) Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න පහකට 05ට පමණක් පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

(01). සංස්කෘතියක් තුළ ක්‍රියාකාරී වන මතු දැක්වෙන ක්‍රියා රටා අතුරින් දෙකක් පිළිබඳ විස්තරාත්මක සටහන් ලියන්න.

(i). සංස්කෘතියේ යථාර්ථය හා පරමාදර්ශය

(ii). සංස්කෘතියේ නවීකරණය හා පරමාදර්ශය

(iii). සංස්කෘතික සංරෝධනය

(iv). සංස්කෘතික සාපේක්ෂතාව

(02). එඩ්මන්ඩ් ලිච්ගේ සංස්කෘතිය හා සන්නිවේදනය (Culture and Communication) කෘතියේ විස්තර වන සංස්කෘතික නිර්ණායක ලාංකේය සංස්කෘතිය විග්‍රහ කිරීම පිණිස, කොතරම් දුරට යොදාගත හැකිදැ'යි විස්තර කරන්න.

(03). පණ්ඩුකාභය රජු විසින් අතිශය සංවිධිත නගරයක් ලෙස අනුරාධපුරය ගොඩනගන ලද ආකාරය වංශකථාගත තොරතුරු මත පදනම් වෙමින් විස්තර කරන්න.

(04). "තන්තිරිමලේ හා බිල්ලෑව යන ලෙන්වල ඇතුළත් ප්‍රාග්ඓතිහාසික ගුහාචිත්‍ර අතර පිටසක්වල ජීවීන් යැයි සැක කළ හැකි චිත්‍ර හමු වී තිබේ." එවන් විශේෂ චිත්‍ර කිහිපයක් පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

(05). ශ්‍රී ලංකාවේ සීගිරිය හා ඉන්දියාවේ අජන්තා ලෙන යන චිත්‍ර කලාගාර තුළ දැකිය හැකි චිත්‍රවල සමවිසමතා පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

(06). ඉසුරුමුණි පෙම් යුවළ නම් මූර්තිය පසුබිමෙහි විද්‍යමාන ඉන්දියානු ගුප්ත යුගයේ ව්‍යාප්ත වූ ශෘංගාර කලාවේ ආභාසය පිළිබඳ සංකථනයක යෙදෙන්න.

(07). ඓතිහාසික පුරාවෘත්තයක කාල යුග පරිණාමය විස්තර කළ හැකි ඓතිහාසික භූගෝල විද්‍යා මූලධර්මය (Historical Geographical) පිළිබඳ අර්ථ දැක්වීමක් කරන්න.

(08). ගිරිදේවී පුරාණෝක්තියට පසුබිම් වූ ව්‍යභිචාරය (incest) පසුකාලීන සමාජයේ ලිංගික තහංචියක් බවට පත් වූ ආකාරය විස්තර කරන්න.

(සැම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි).